මාවනැල්ල අධ්‍යාපන කලාපය
**Mawanella Education Zone**

තෙවන වාර පරීක්ෂණය - 2019 | 6 ශ්‍රේණිය
**Third Term Test - 2019** | **Grade 6**

විද්‍යාව I , II | කාලය : පැය 2 යි
**Science I, II** | **Time : 2 hours**

නම: ………………………………………………………………………….

## I කොටස

- වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(01) කාලගුණය පිළිබඳව තොරතුරු ඉදිරිපත් කිරීමේදී බහුලව භාවිත වන සාධක වන්නේ
1. වර්ෂාපතනය 2. උෂ්ණත්වය
3. ආර්ද්‍රතාවය 4. ඉහත සියල්ලම

(02) ආහාර දාමයක නිෂ්පාදකයා වන්නේ
1. ශාක භක්ශකයෙකි 2. ශාකයකි
3. මාංශ භක්ෂකයෙකි 4. සර්ව භක්ෂකයෙකි

(03) උෂ්ණත්වමානයක අඩංගු වන ද්‍රව්‍ය වනුයේ
1. රසදිය 2. ජලය
3. භූමිතෙල් 4. පොල්තෙල්

(04) ප්‍රතිරෝධකයේ සම්මත සංකේතය වනුයේ,
1. 
2. 
3. 
4. 

(05) දිශාව සොයාගැනීමට භාවිත කරන උපකරණය වනුයේ,
1. සුළං දිශා දර්ශකය 2. මාලිමාව
3. අනිල මානය 4. පාන මානය

(06) තන්තු කම්පනයෙන් හඬ නිපදවන භාණ්ඩයක් නොවන්නේ,
1. සර්පිනාව 2. ගිටාරය
3. සිතාරය 4. වයලීනය

(07) ආලෝකයේ ප්‍රයෝජනය/ ප්‍රයෝජන වන්නේ,
a) ශාකවල ආහාර නිපදවීමට
b) ශාකවල ශ්වසනයට
c) සන්නිවේදන කටයුතුවලට
1. a පමණි 2. a හා b පමණි 3. a හා c පමණි 4. a, b හා c සියල්ලම

(08) දීප්ත වස්තුවක් නොවන්නේ,
1. සූර්යයා 2. කණාමැදිරියා
3. ඉටිපන්දම 4. චන්ද්‍රයා

(09) සූර්යයාගේ ශක්තිය අපට ලැබෙනුයේ,
1. තාපය ලෙස 2. ආලෝකය හා තාපය ලෙස
3. ආලෝකය ලෙස 4. ඉහත කිසි ආකාරයකට නොවේ

(10) පියවි ඇසින් නොපෙනෙන ජීවීන් නිරීක්ෂණයට වඩාත් සුදුසු උපකරණය වන්නේ,
1. දෙනෙතිය 2. දුරේක්ෂය
3. අත්කාචය 4. සංයුක්ත අන්වීක්ෂය

(11) ජීවීන් තුළ ශක්තිය නිපදවන ක්‍රියාවලිය වනුයේ,

1. වර්ධනය 2. ශ්වසනය
3. පෝෂණය 4. ප්‍රජනනය

(12) පදාර්ථයක් නොවන්නේ,

1. තාපය 2. වාතය
3. ජලය 4. පස

(13) මෘදු වයනයක් ඇති ද්‍රව්‍යකි,

1. වැලි 2. මැටි
3. ගඩොල් 4. බොරළු

(14)



ඉහත උපකරණය භාවිත කරනුයේ,

1. ආර්ද්‍රතාවය මැනීමට 2. සුළගේ දිශාව මැනීමට
3. සුළගේ වේගය මැනීමට 4. වර්ෂාපතනය මැනීමට

(15) ශාක ⟶ හාවා ⟶ කොටියා

ඉහත ආහාර දාමයේ දෙවන පුරුක වන්නේ,

1. ශාක 2. කොටියා
3. හාවා සහ කොටියා 4. හාවා

(16) ශාකවල ආහාර නිපදවීමට වායුගෝලයෙන් ලබාගන්නා වායුව වනුයේ,

1. කාබන්ඩයොක්සයිඩ් වායුව 2. හයිඩ්‍රජන් වායුව
3. ඔක්ෂිජන් වායුව 4. නයිට්‍රජන් වායුව

(17) රසදිය ලෝහය කාමර උෂ්ණත්වයේදී පවතින්නේ,

1. ඝන ලෙසය 2. ද්‍රව ලෙසය
3. වායු ලෙසය 4. කැට ලෙසය

(18) විදුලිය ගලායන ද්‍රව්‍යක් නොවන්නේ,

1. මිනිරන් කූර 2. තඹ කම්බිය
3. කඩදාසි 4. හැට්ට කටුව

(19)



ඉහත දක්වා ඇත්තේ,,

1. පෙති චුම්භකයකි 2. දණ්ඩ චුම්භකයකි
3. බූරප චුම්භකයකි 4. වලයාකාර චුම්භකයකි

(20) මිනිසාගේ ශරීර උෂ්ණත්වය සෙල්සියස් අංශක වලින්,

1. 37 $^{0}$C කි 2. 87 $^{0}$C කි
3. 77 $^{0}$C කි 4. 97 $^{0}$C කි

## II කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ.
- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

(01)




i. ඉහත දක්වා ඇති සටහන හඳුන්වන නම කුමක්ද?
ii. ඉහත සටහනෙහි නිෂ්පාදකයා නම් කරන්න.
iii. ශාක භක්ෂකයින් දෙදෙනෙකු නම් කරන්න.
iv. මාංශ භක්ෂකයින් දෙදෙනෙකු නම් කරන්න.
v. සර්ව භක්ෂකයින් දෙදෙනෙකු නම් කරන්න.
vi. ඉහත සටහනෙන් පුරුක් තුනක ආහාර දාමයක් ලියන්න.
vii. ශාක ආහාර නිපදවීම සඳහා ශක්තිය ලබාගන්නේ කාගෙන්ද?
viii. ශාක ආහාර නිපදවීමේදී වායුගෝලයට එකතුවන වායුව කුමක්ද?
ix. ශාකවල ආහාර නිපදවීමේ ක්‍රියාවලිය හඳුන්වන නම කුමක්ද?
x. ආහාර ජාල දක්නට ලැබෙන ස්ථානයක් නම් කරන්න. (ල. 2 x 10)

(02) හරි නම් ( √ ) ලකුණද, වැරදි නම් (x) ලකුණද යොදන්න.

i. ඩයිනමෝව භාවිතා කර විදුලිය නිපදවිය හැකිය. (     )
ii. කුඩා විදුලි ධාරාවක් මැනීමට ගැල්වනෝ මීටරය භාවිතා කරයි. (     )
iii. රිද්මයානුකූල නොවන ශබ්ද සංගීතය වේ (     )
iv. සයිලෆෝනය තහඩු කම්පනයෙන් හඬ නිපදවේ (     )
v. අන් අයට බාධා නොවන පරිදි ශබ්දය භාවිත කළ යුතුය (     )
vi. අල්පෙනෙති චුම්භකවලට ආකර්ෂණය නොවේ. (     )
vii. චුම්භකවල සජාතීය ධ්‍රැව ආකර්ෂණය වේ (     )
viii. බදුල්ල, නුවරඑළිය වැනි ප්‍රදේශවල නායයෑම් බහුලය (     )
ix. පරිසර හිතකාමී ලෙස කටයුතු කිරීමෙන් ස්වභාවික ආපදා අවම කරගත හැකිය (     )
x. ශ්‍රී ලංකාවට බලපාන සුළි සුළං හටගන්නේ බෙංගාල බොක්ක ආශ්‍රිතවය. (     )

(ල 1 x 10)

(03) හිස්තැන් පුරවන්න.

i. ද්‍රව්‍යක උණුසුමේ ප්‍රමාණය ................................ නම් වේ.
ii. තාපය ලැබීම නිසා ද්‍රව්‍ය ප්‍රමාණයෙන් විශාල වීම ........................................ ලෙස හැඳින්වේ.
iii. ද්‍රව ප්‍රසාරණය උදව් කරගෙන .......................................... නිපදවා ඇත.
iv. තාපය ලැබීම නිසා ඝනයක් ද්‍රව බවට පත්වීම ............................... කි.
v. යකඩ කැබැල්ලක් රත්කරන විට පළමුව එය .................................... පැහැයට හැරේ.
vi. ........................................ වායුව පරිසරයට එකතුවීම නිසා පරිසර උෂ්ණත්වය ඉහළයයි.
vii. සාගර ජලයේ උෂ්ණත්වය වෙනස් වීමෙන් ............................ ඇතිවේ.

viii. ...................................... අපගේ ප්‍රධාන තාප ප්‍රභවය වේ.

ix. ජලය නටන විට කොතරම් තාපය සැපයූවත් උෂ්ණත්වය .............................. නොවේ.

x. තාපය ඉවත්ව යන විට ද්‍රව්‍ය .................................. වේ.

(සංකෝචනය, වෙනස්, සූර්යයා, දියවැල්, කාබන්ඩයොක්සයිඩ්, රතු, අවස්ථා විපර්යාසය, උෂ්ණත්ව මානය, ප්‍රසාරණය, උෂ්ණත්වය)

(ල 1 x 10)

(04) පහත දක්වා ඇත්තේ විදුලිය නිපදවීමට භාවිත කරන ඇටවුමකි.




i. A, B, C, D, E කොටස් නම්කරන්න. (ල 1 x 5)

ii. මෙම ඇටවුම හඳුන්වන නම කුමක්ද? (ල 1 )

iii. රසායනික කෝෂ මූලික වර්ග දෙක නම් කරන්න. (ල 1 x 2)

iv.




දී ඇති රූප සටහන පරිපථ සංකේත භාවිතයෙන් නැවත අඳින්න.
(ල. 2)

(05) යා කරන්න.

| | | |
|---|---|---|
| (i) | පෙනීමට අවශ්‍ය සාධකයකි. | සංගීතය |
| (ii) | ආලෝකය නිකුත් කරන වස්තු | චුම්භක ක්ෂේත්‍රය |
| (iii) | පාරදෘශ්‍ය ද්‍රව්‍යකි | කණ |
| (iv) | ආලෝක කිරණ සමූහයක එකතුවකි. | නොරොච්චෝලෙ |
| (v) | පරමාණුවලින් ලබාගන්නා ශක්තිය | චුම්භක ධ්‍රැව |
| (vi) | ශ්‍රී ලංකාවේ තාප විදුලිබලාගාරයක් පිහිටා ඇත | න්‍යෂ්ටික ශක්තිය |
| (vii) | ශබ්දය සඳහා සංවේදී ඉන්ද්‍රියයි | ආලෝක කදම්භය |
| (viii) | චුම්භකයක චුම්භක බලය වැඩිපුර ඇති දෙකෙළවර වන්නේ | පිරිසිදු ජලය |
| (ix) | චුම්භකයක් වටා චුම්භක බලය පැතිරී ඇති ප්‍රදේශය | ආලෝක ප්‍රභව |
| (x) | රිද්මයකට අනුව ගැයෙන වැයෙන ශබ්ද | ඇස |

(ල 1x 10)

(06)

(i) පදාර්ථයේ අවස්ථා තුන නම් කරන්න. (ල. 02)

(ii) පහත භෞතික ගුණ පෙන්වන ද්‍රව්‍ය එක බැගින් ලියන්න.

දෘඩබව , ප්‍රත්‍යස්ත බව භංගුර බව

(ල 1x 3)

(iii) ලවණතාව ප්‍රයෝජනයට ගතහැකි අවස්තා 3ක් ලියන්න (ල 03)

(iv) මිනිසාට ප්‍රයෝජනයට ගතහැකි ජල ප්‍රතිශතය කොපමණද? (ල 01)

(v) මුහුදු ජලයේ බහුලව දියවී ඇති ලවණය කුමක්ද? (ල 01)